**රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අස්ථිත්වයක වත්කම් එම අස්ථිත්වය විසින් පාලනය කළ යුතු අතර අස්ථිත්වයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා එම වත්කම් ප්‍රයෝජනවත් විය යුතුය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ වටිනාකම රු. 44,203,144 ක් ලෙස වාර්තා කර තිබුණ ද එම වත්කම් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා නොකොට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් එහි මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය වූ අතර මෙම වත්කම්වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය වූ රු. 5,305,911 ක මුදල අරමුදලේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිරීක්ෂණයේ දක්වා ඇති සංඛ්‍යාවන් නිවැරදියි. | මෙම අරමුදල වෙනම අස්ථිත්වයක් බැවින් අරමුදලේ ප්‍රයෝජනය සඳහා යොදාගන්නා වත්කම් පමණක් එම අරමුදල යටතේ ගිණුම්ගත කළ යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් සටහන් අනුව දේපළ ,පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය සරල මාර්ග ක්ෂය ක්‍රමය ලෙස දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ හා පූර්ව වර්ෂයේ හීනවන ශේෂ ක්‍රමය මත පදනම්ව ක්ෂය ගණනය කර තිබූ අතර එම ප්‍රතිපත්තිය වෙනස් කිරීම පිළිබඳ කිසිදු අනාවරණයක් සිදු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය පෙර වර්ෂයන්හි පරිදිම හීනවන ශේෂ ක්‍රමය මත පදනම්ව සකස් කරන ලද අතර 2.8 සටහනේ එය අතපසුවීමකින් සරල මාර්ග ක්‍රමය ලෙස දක්වා ඇති අතර එය හීනවන ශේෂ ක්‍රමය ලෙස නිවැරදි විය යුතු බව වාර්තා කරමි. | නිවැරදි ක්ෂය ක්‍රමය අනුගමනය කර වාර්ෂික ක්ෂය ගණනය කර ගිණුම්ගත කළ යුතුයි. |
| (ආ) | ධාරණ අගය ශුන්‍ය වූ නමුත් මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගන්නා පිරිවැය රු.22,258,264 ක දේපළ, පිරියත හා උපකරණ නැවත අගය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. | රූපවාහිනී යන්ත්‍ර සහ 2015 වර්ෂයටත් පෙර මිලදී ගන්නා ලද උපාංග වසර 7 ක් ඉක්මවා ඇත. පරිගණක මෘදුකාංග 2016 වර්ෂයේ හා ඊට පෙර මිලදී ගන්නා ලද උපාංග බැවින් වසර 5 කටත් අධික කාලයක් පැරණි උපාංග වන අතර වගකීම් කාලයද අවසන් වී ඇත. එබැවින් මෙම වත්කම් නැවත අගය කිරීමක් ප්‍රායෝගික නොවන බව වාර්තා කරමි. | තව දුරටත් භාවිතා කළ හැකි තත්ත්වයක් පවතින්නේ නම් සුදුසු ක්‍රමයක් අනුගමනය කර ගිණුම්ගත කළ යුතු බව. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ හා වන්දි අරමුදලේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර ආරම්භක ශේෂයන්හි රු.2,122,369 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2018 වර්ෂයට පෙර සිට පවතින වෙනසක් වේ. මේ වන විට එම වෙනස හඳුනා ගැනීමට කටයුතු කරමින් ඇති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දත්තයන් අතර යම් වෙනස්කමක් වූයේ නම් එම වෙනස්කම් සසඳා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 855,371,840 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 445,228,992 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 410,142,848 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම හා දණ්ඩන ආදායම් පිළිවෙලින් රු. 152,542,726 ක් හා රු. 250,605,474 කින් වැඩිවීම හා විවිධ වියදම් රු. 22,422,429 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 වාර්ෂික කාර්යසාධනය

විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 20 කට සමාන මුදල් ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කරනු ලබන අතර රේගු ආඥා පනතේ 153 (ආ) 1 වගන්තිය අනුව අරමුදලේ කාර්යයන් පහත සඳහන් පරිදි විය.

- රේගු කළමනාකරණයෙහි සඵලතාව වර්ධනය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන පහසුකම් සැලසීම සඳහා වියදම් දැරීම.

- ස්ථිර වශයෙන් හෝ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අබල වූ හෝ තාවකාලික අශක්නුතාවයකට පත් වූ යම් රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම.

- යම් රේගු නිලධාරියෙකු මිය ගිය විට ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට වන්දි ගෙවීම.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැලසුම් කිරීමකින් තොරව මෙම අරමුදලට මුදල් වෙන් කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,775 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 8,611 ක් දක්වා රු. මිලියන 836 කින් හෙවත් සියයට 11 කින් වර්ධනය වී ඇති බවක් නිරීක්ෂණය විය. අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය සඳහා පහත සඳහන් හේතු ද මූලික ලෙස බලපා තිබුණි. | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව රේගු විමර්ශන වල විකුණුම් හා දණ්ඩන මගින් පනවන ලද දඩ මුදලින් අදාල වියදම් ඇතොත් එය අඩු කිරීමෙන් පසු සියයට 20 ක ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කෙරේ.ඒ අනුව සම්මුච්චිත ශේෂයක් අරමුලේ ඇති අතර වාර්ෂිකව ප්‍රවර්ථන ශේෂයන් එයට එකතු වේ. ඒ අනුව අරමුදල් අගය වාර්ෂිකව ඉහළ යයි. 2021.12.31 දිනට ගිණුමේ ශේෂය රු.මිලියන 8,566 කි.ඇතිවී තිබෙන පරිගණක හා අනෙකුත් තාක්ෂණ දියුණුව උපයෝගී කර ගෙන ඉතා සැලසුම් සහගත ලෙස කණ්ඩායම් වශයෙන් වංචා හා අක්‍රමිකතා සිදු කිරීම සමස්ථයක් වශයෙන් ලෝකය පුරා වර්ධනය වී ඇති බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව අප රට තුළද මෙවැනි වංචාකාරී ලෙස මුදල් ඉපයීමේ ප්‍රවනතාවය වැඩි වීමේ තත්ත්වය තුළ රේගු බදු වංචාවන්ගේ අඩුවීමක් අපේක්ෂා | රේගු ආඥා පනත මේ වන විට වසර 153 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී පැවති ආනයනය අපනයන තත්ත්වයක් මත එම පනත පිළියෙළ කර තිබුණි. එහෙත් එය වර්ථමාන ගතික ලක්ෂණයන් සැලකිල්ලට ගෙන වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (i) | රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවර අනුගමනය නොකිරීම හේතුවෙන් ඇතිවන විවිධ රේගු වැරදි සඳහා නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට සිදුවීමත් ඉන් සියයට 20 කට සමාන ප්‍රතිශතයක් මෙම අරමුදලට බැර වීමත් හේතුවෙන් මෙම අරමුදල අඛණ්ඩව වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂ 10 ක කාලය තුළ අරමුදලට මුදල් ලැබී තිබුණු රේගු විමර්ශන 2740 කින් මෙම අරමුදලට මුදල් බැර වී තිබුණු අතර එම වටිනාකම රු. මිලියන 6,922 ක් පමණ වී තිබුණි. | කිරීම අපහසු වේ.<br>නිරීක්ෂණයන් හා එකඟ වේ. | නිලධාරීන්ගේ සඵලතාවය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |
| (ii) | රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායම ද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීමත් එම දණ්ඩනය පදනම් කරගෙන නිලධාරීන්ගේ ත්‍යාග තීරණය කිරීමත් හේතුවෙන් ඒකාබද්ද අරමුදලට බැර විය යුතු රාජ්‍ය ආදායම අහිමි වී රේගු නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් සිදු වී තිබුණි. | රේගු වරදක් දණ්ඩනයක් පැන වීමට හැකියාවක් ලැබෙන්නේ එම වරද අනාවරණය කර ගැනීමට නිලධාරීන් සූක්ෂම වී කටයුතු කරන නිසා ය. එසේ සූක්ෂම වී යම් වරදක් අනාවරණය කර ගත්තේ නැති නම් එම සිද්ධියට අදාල මුළු ආදායම් ප්‍රමාණයම ඇතැම් විට රජයට අහිමි වන මුදලක් බවට පත් වේ. නමුත් නිලධාරීන් ගේ දක්ෂතාවය මත එම රේගු වරද අල්ලා ගැනීමට හැකිවීම තුළ එකතු කර ගන්නා මුදලින් 30% ක ප්‍රමාණයක් රජයට ලැබෙන නිසා රජයේ ආදායමට යම් ප්‍රමාණාත්මක දායකත්වයක් ලැබෙන අතරම, නිලධාරීන් තුළ රේගු වැරදි අල්ලා ගැනීමට ඇති වන පෙළඹවීම ද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වේ. | රේගු වැරදි මුල් අවස්ථාවේදීම අනාවරණය කර ගැනීම රේගු නිලධාරීන්ගේ රාජකාරියක් බව පෙනී යයි. මුල් අවස්ථාවේදී රේගු වරද අනාවරණය කර නොගැනීම හේතුවෙන් පසු අවස්ථාවකදී නැවත රේගු නිලධාරීන් විමර්ශනයක් සිදු කර ලබා ගන්නා දඩ හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් තුළින් සියයට 70 ක්ම ඒකාබද්ධ අරමුදලට නොඒම සම්බන්ධව සමාලෝචනයක් සිදුකර අවශ්‍ය පියවර ගත යුතුවීම. |
| (iii) | වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනවල ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම මෙම වර්ධනයන් සඳහා මූලික වශයෙන් බලපා තිබුණි. | විස්තරාත්මකව වාර්තාවක් ලබාදී නොමැති අතර තවදුරටත් සාකච්ඡා කිරීමට ඇති බව සඳහන් කොට තිබුණි. | රේගු ආඥා පනත මේ වන විට වසර 153 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණ ද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගෙන වර්තමානයට ගැලපෙන පරිදි පවතින පනත සංශෝධනය කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ ආදායම රු. මිලියන 897 ක් වුවද අරමුදලේ මූලික අරමුණු වෙනුවෙන් වැයකර ඇති මුදල ආසන්න වශයෙන් රු. මිලියන 41 ක් විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. මෙම අරමුදලේ මූලික අරමුණු වන දේශීය හා විදේශීය පුහුණුවීම් ඇතුලු සියලු වියදම් දැරීම රටේ පැවති කොරෝනා වසංගත තත්වය හමුවේ රට වරින් වර වසා දැමීම මත සැලසුම් කළ පරිදි එම කටයුතු සඳහා නිලධාරින් යොමු නොකිරීම, විදේශ නියෝජිතයන් නොපැමිණීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. මෙම තත්ත්වය පෙර වර්ෂයන් හා සැසඳිය නොහැකි විශේෂිත තත්ත්වයක් බව වැඩිදුරටත් වාර්තා කරමි. | පනත සංශෝධනය කළ යුතු වීම හා රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම හා සේවක සුභසාධනය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුවීම. |
| (ඇ) මෙම අරමුදලේ මූලික අරමුණුවලින් එකක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරිවල නිරතවීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණ ද පරීක්ෂාවට භාජනය කරන ලද ඉකුත් වර්ෂ 08 ක කාල පරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබුණි. ඒ අනුව එම අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් තවදුරටත් මෙම අරමුදලට අසාමාන්‍ය ලෙස මුදල් රැස්කිරීමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඉහත වර්ෂ 8 තුල එවැනි ආපදාවන් වෙනුවෙන් වන්දි ඉල්ලීම් කිසිවක් ලැබී නොතිබිණි.තවද, රේගු වැරදි අල්ලා ගැනීමට දැඩි කැපවීමකින් කටයුතු කරන අවංක නිලධාරීන්හට ජීවිත තර්ජනද ඇති වී ඇති බැවින්, එම නිලධාරීන්ට ජීවිත අවධානම ද නොතකා රාජකාරි වෙනුවෙන් කැපවීමට මෙවැනි අරමුදලක විශාල මුදලක් පැවතීම රක්ෂණ අරමුදලක් මෙන් ඔවුන්ගේ පවුල්වලට හොඳ සුරක්ෂිතභාවයක් තහවුරු කරයි. එය නිලධාරීන්ගේ රාජකාරි ඉටු කිරීමේදී ජීවිත අවධානම් නොතකා රාජකාරි සඳහා කැප වීමට දිරිගැන්වීමක් සිදු කරයි. එසේම මෙම අරමුදලට මෙසේ මුදල් වෙන් කිරීම රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර සිදු කරනු ලබන බව වැඩිදුරටත් වාර්තා කරමි. | පනත සංශෝධනය කළ යුතු වීම හා රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |

**3.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම සැසඳීමේදී වියදම් විෂයයන් 7 ක සියයට 41 ක සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරණයක් ලෙස යොදාගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය. | වාර්තාවේ දක්වා ඇති සංඛ්‍යාවන් නිවැරදියි. මෙම අරමුදලේ මූලික අරමුණු වන දේශිය හා විදේශිය පුහුණුවීම් ඇතුලු සියලු වියදම් දැරීම රටේ පැවති කොරෝනා වසංගත තත්වය හමුවේ රට වරින් වර වසා දැමීම මත සැලසුම් කළ පරිදි එම කටයුතු සඳහා නිලධාරින් යොමු නොකිරීම සහ විදේශ නියෝජිතයන් නොපැමිණීම නිසා මෙම තත්ත්වය ඇති වි ඇත. මෙම තත්ත්වය පෙර වර්ෂයන් හා සැසඳිය නොහැකි විශේෂිත තත්ත්වයක් බව වැඩිදුරටත් වාර්තා කරමි. | අයවැය පිළියෙල කිරීමේදී නිසි පරිදි අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිපාදනයන් සැලසිය යුතු වීම. |